# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2141/85 - 2019 සැප්තැම්බර් මස 20 වැනි සිකුරාදා - 2019.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### චන්දනාගමන් ආඥාපනත

අම්මඩුව කුඩා කතරගම දේවාලයේ ඇසළ පෙරහැර - 2019

2019 වසරේ ඇසළ පෙරහැර මංගල්‍ය සහ ඔක්තෝබර් මස 02 වන දින සුභ මොහොතින් ආරම්භ කෙරේ.

- ඔක්තෝබර් මස 02 දින කප් සිටුවීමේ චාරිත්‍රය සිදු කර සර්වරාත්‍රික පිරිත් දේශනය පැවැත්වීම.
- ඔක්තෝබර් මස 08 වන දින දක්වා කුඹල් පෙරහැර පැවැත්වීම.
- ඔක්තෝබර් මස 09 දින සිට ඔක්තෝබර් මස 13 දින දක්වා දෙවේලේ පෙරහැර මංගල්‍ය පැවැත්වේ.
- ඔක්තෝබර් මස 14 දින සිට ඔක්තෝබර් මස 18 වන දින දක්වා දෙවේල පෙරහැර මංගල්‍ය පැවැත්වේ.
- ඔක්තෝබර් මස 19 දින උදෑසන දිය කැපීමේ මංගල්‍ය සිදුකර දහවල් පෙරහැර මංගල්‍ය පවත්වා ගෙවදීමේ මංගල්‍ය සිදුකර හා ගරායක් ශාන්ති කර්මය සිදුකර 2019 වාර්ෂික ඇසල මහා පෙරහැර නිමාවට පත් කෙරේ.

2. දේවාලයේ උතුරට පිටුපස මූකලාන ද දකුණට රංවල අම්මඩුව පාරද නැගෙනහිරට දේවගිරි කපු මහතාගේ ඉඩම් ද බස්නාහිරට හීන් නිලමේ මහතාගේ ඉඩම ද මායිම් වේ.

3. ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුරු පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලි සාදන ස්ථානයක්, භෝජනාගාරයක් හෝ දන්සලක් තත්කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාරපාන බෙදා හැරීමේ දී විකිණීමේ දී හෝ නිෂ්පාදනය කිරීමේදී සහභාගි වීමට බලය නැත.

4. දිසාපතිවරයාගේ ලිඛිත අවසර නොමැතිව කිසිම තැනැත්තෙකු විසින් කිසිම ගවයෙක් හෝ වෙනත් යම් සතෙකු කඳවුරු පෙදෙස තුළට ගෙන ඒම නොකළ යුතු ය.

5. කඳවුරු පෙදෙස තුළට හෝ කඳවුරු පෙදෙසෙන් පිටතට හෝ කඳවුරු පෙදෙස ඇතුළත හෝ වාහන ගමනාගමනය හෝ පයින් ගමන් කිරීම තහනම්, එසේ වුවද හත් වැනි නියෝගය යටතේ කරත්ත හා ගොනුන් නවතා තැබීම සඳහා වෙන් කරනු ලැබ ඇති ස්ථානයක් කරා කරත්ත ගෙනයාම ගොනුන් දක්කා ගෙන යාම සම්බන්ධයෙන් මෙම නියෝග අදාළ නොවන්නේ ය.

6. කඳවුරු පෙදෙස තුළ පිහිටි සියලු බේකරි, කැවිලි හල් කැවිලි සාදන ස්ථාන, භෝජනාගාර දන්සල් සහ වෙළඳ ව්‍යාපාරික කාර්යයක් සඳහා පාවිච්චි කරනු ලබන ගොඩනැගිලි හෝ ඉදිකිරීම් සඳහා ඝණ මීටර් 1 ට (ඝණ අඩි 4) නොඅඩු ධාරිතාවක් ඇති දැවමය හෝ ලෝහමය කසළ බඳුනක් සපයනු ලැබිය යුතු අතර එකී කසළ බඳුන තැන්පත් කරන විට හෝ හැර සෑම අවස්ථාවකම දීම ද්‍රවමය හෝ ලෝහමය පියනකින් වසා තිබිය යුතු ය.

1A - G 31035 — 20 (2019/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

7. තේ අපද්‍රව්‍ය, කෝපි අපද්‍රව්‍ය, කිරි අපද්‍රව්‍ය, හෝ යම් ආහාරයක හෝ පානයක ඉතිරි කොටස් හෝ පිසීමේ දී ඉවතලන ද්‍රව්‍ය හෝ වෙනත් ඉවතලන ද්‍රව්‍ය කිසිවක් කඳවුර පෙදෙස තුළ කිසිම ස්ථානයක බිමට විසිකරනු නොලැබිය යුතු ය. එවැනි සියලු අපද්‍රව්‍ය ඉතිරි කොටස් හෝ ඉවතලන ද්‍රව්‍ය 19 වන නියෝගයේ විධිවිධාන සලසා ඇති ආකාරයට තබා ඇති භාජනයකට දැමිය යුතු ය. එසේම ඉවතලන අපද්‍රව්‍ය කඳවුර පෙදෙස ඇතුළත යම් ස්ථානයක බිමෙහි හෝ ඒ අසල පෙළොවෙහි විසිකොට තිබෙන බව පෙනී ගියහොත් ඒ ස්ථානයේ අයිතිකරු ප්‍රධාන පදිංචිකරු හෝ ස්ථානයේ බලපත්‍රධාරියා විසින් එම වරද සිදු වීම වැළැක්වීමට අවශ්‍ය සියලු පූර්වෝපායන් යෙදූ බව සහ සැලකිල්ලෙන් ක්‍රියාකළ බව ඔප්පු කරනු ලැබුවහොත් එකී අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු හෝ එකී බලධාරියා මේ නියෝගයේ විධිවිධාන කඩකර ඇති ලෙස සලකනු ලැබේ.

8. දිස්ත්‍රික් ලේකම්වරයාගේ මතයට අනුව මෙම නියෝගවල 15 වැනි 16 වැනි 17 වැනි 18 වැනි 19 වැනි නියෝග කඩකරමින් පිහිටුවනු ලැබ ඇත්තාවූ පවත්වාගෙන යනු ලබන්නා වූ ද කඳවුරු පෙදෙස තුළ පිහිටියා වූ ද යම් බේකරියක්, කැවිලි හලක් හෝ කැවිලි සාදන ස්ථානයක් භෝජනාගාරයක්, දන්සලක් හෝ යම් වෙළඳ ව්‍යාපාරික ස්ථානයක් වසා දැමීමට නියම කිරීමේ හා ඒ ස්ථානය වෙනුවෙන් යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ තිබේනම් එකී බලපත්‍ර වහාම අවලංගු කිරීමට බලය ඇත.

9. කඳවුරු පෙදෙස තුළ යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති සෑම තැනැත්තෙක්ම ද යම් තැනැත්තෙකුට යම් ආසාදන රෝගයක් හෝ ස්පර්ශක රෝගයක් වැළඳී ඇති බව දන දනම ඒ තැනැත්තා සමග එකට වාසය කරන විටෙකත් සෑම තැනැත්තෙක්ම ද ඒ බව වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වහාම වාර්ථා කළ යුතු ය.

10. ආසාදන රෝගයකින් ස්පර්ශක රෝගයකින් පෙළෙන හෝ පෙළෙන්නේ යැයි තමා දන්නා කිසිම තැනැත්තෙකුට කඳවුර පෙදෙස ඇතුළත යම් බේකරියක්, කැවිලිහලක් හෝ කැවිලිසාදන ස්ථානයක්, හෝ භෝජනාගාරයක් හෝ දන්සලක් තත්කාලයේ භාරව සිටින යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියට, කැවිලිහලට හෝ කැවිලි සාදන ස්ථානයට, භෝජනාගාරයට හෝ දන්සලට ඇතුළුවීමට හෝ යම් ද්‍රව්‍යයක් ආහාර පාන බෙදා හැරීමේ දී, හෝ නිෂ්පාදනය කිරීමේ දී සහභාගිවීමට බලය ඇත.

11. යම් බේකරියක, කැවිලිහලක හෝ කැවිලි සාදන ස්ථානයක, භෝජනාගාරයක හෝ දන්සලක බලපත්‍රධාරියකු විසින් හෝ යම් නවාතැන්පලක හෝ වන්දනාකරුවන් ගේ විශ්‍රාමශාලාවක අයිතිකරු හෝ ප්‍රධාන පදිංචිකරු විසින් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් හෝ පෙළෙන යම් තැනැත්තෙකුට අවස්ථාවෝචිත පරිදි ඒ බේකරියේ, කැවිලිහලේ හෝ කැවිලි සාදන ස්ථානයේ භෝජනාගාරයේ, දන්සලේ, නවාතැන්පලේ හෝ වන්දනාකරුවන්ගේ කවර හෝ කාලසීමාවක් නැවතී සිටීමට ඉඩ නොදිය යුතු ය. එවැනි ස්ථානයක ආසාදන රෝගියෙකු හෝ ස්පර්ශක රෝගියෙකු සිටින බව අනාවරණය වූ අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි එහි බලපත්‍රධාරියා විසින් හෝ ඒ බව වෛද්‍ය නිලධාරියාට හෝ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාට හෝ යම් පොලිස් නිලධාරියෙකුට වහාම වාර්ථා කළ යුතු ය.

12. 7 වැනි නියෝග යටතේ සිගමන් යැදීම හා පිනට ඉල්ලා ගැනීම සඳහා වෙන් කරනු ලැබ ඇති හෝ සපයනු ලැබ ඇති යම් ස්ථානයකදී හැර කඳවුර පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට දීමට හෝ පිනට යමක් බෙදා හැරීම හෝ නොකළ යුතු ය.

13. 7 වැනි නියෝග හෝ 10 වැනි නියෝගය යටතේ යම් ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබ ඇති යම් දැන්වීමක් හෝ නාම පුවරුවක් කිසිම තැනැත්තෙකු විසින් අයුතු ලෙස වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය.

14. දිස්ත්‍රික් ලේකම්, වෛද්‍ය නිලධාරියා, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා හෝ පොලිස් නිලධාරියකු විසින් (අ) මේ නියෝග අතුරින් යම් නියෝගයක් හෝ ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ ඇති යම් ඉඩමකට හෝ ස්ථානයකට හෝ ඇතුළුවීම සහ (ආ) වැනි නියෝග යටතේ යම් දැන්වීමක් නාම පුවරුවක් නාම ප්‍රදර්ශනය කර තැබීමෙන් කාර්යය සඳහා කඳවුරු පෙදෙස තුළ යම් ඉඩමක හෝ ස්ථානයක යම් කණුවක් සිටුවීම හෝ ඉදි කිරීමක් ගොඩනැගීම නීත්‍යානුකූල වන්නේ ය.

අනුරාධ ජයකොඩි,
ප්‍රාදේශීය ලේකම්,
වැලිගෙපොල.

10 - 202

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.